# ජාතික ලැයිස්තුවේ අරමුණ ඉටුවෙන සේ නීති හදන්න

## - පැෆරල් සංවිධානය

ගයාලි ගීගනආරච්චි

ඉදිරියේදී ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර නම් කිරීමේදී එහි ප්‍රධාන අරමුණු ඉටුවන ආකාරයට ජාතික ලැයිස්තු පිරවීමට අදාළ නීති හා නිර්ණායක සකස් කරන ලෙස වත්මන් පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටින බව පැෆරල් සංවිධානය පවසයි.

යම් හෙයකින් සුවිශේෂී හේතූන් මත පරාජිත අපේක්ෂකයෙක් ගැනීමට සිදුවන්නේ නම් ඒ සඳහා විශේෂ නිර්ණායක හා සීමාවන් පැනවීමට ක්‍රියා කරන ලෙසත් මෙහිදී කාන්තා නියෝජනය කෙරෙහිද අවධානය යොමු කළ යුතුව ඇති බවත් පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

ජාතික ලැයිස්තුව හඳුන්වා දීමේ මුඛ්‍ය අරමුණ වන්නේ නියෝජනයක් නොලබන කණ්ඩායම්වලට ව්‍යවස්ථාදායකය තුළ නියෝජනයක් ලබාදීම හා තරඟකාරී මැතිවරණවලට සම්බන්ධ වීමට අකමැති උගත්, බුද්ධිමත් සහිත පුද්ගලයන්ගේ දැනුම, නීති ප්‍රතිපත්ති සම්පාදනයට එක්කර ගැනීම බවද ඒ මහතා පෙන්වා දෙයි.

එහෙත් අද වනවිට මෙම අරමුණු නොසලකා දේශපාලන අරමුණු පමණක් සලකා බලන තත්ත්වයට එය පත්ව ඇති බවද හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි.